# මාර්ගගත ක්‍රමයට සහතිකපත් නිකුත් කිරීම

**අයදුම්කරුවන් සඳහා උපදෙස්**

01. මාර්ගගත ක්‍රමයට අයදුම්කළ හැකි වනුයේ 2001 වසර හා ඉන්පසු වසරවල පවත්වන ලද අ.පො.ස. (සා/පෙළ) සහ අ.පො.ස. (උ/පෙළ) විභාගවලට අදාළ සහතිකපත් පමණි.

02. අදාළ සහතිකයෙහි හිමිකරු විසින් ම පමණක් සහතිකපත් අයදුම් කළ යුතු ය.

03. **ජාතික හැඳුනුම්පත් අංකය, දුරකථන අංකය, ඊමේල් ලිපිනය, විභාග අංකය හා වර්ෂය** යනාදී තොරතුරු නිවැරදි ව ඇතුළත් කළ යුතු ය. එම තොරතුරු පිළිබඳ සියලු වගකීම් අයදුම්කරු සතු වේ.

04. **අයදුම්කරු (සහතිකය හිමිකරු) විසින් සිදුකරන ලද කිසිදු ගෙවීමක් ආපසු ගෙවනු නොලැබේ.**

05. අදාළ විභාගයෙහි සියලු ම විෂයයන් සඳහා පෙනී නොසිටි අයදුම්කරුවන්ට සහතික පත්‍රයක් නිකුත් කරනු නොලැබේ. **එවැනි අයදුම්කරුවන් සහතිකපත්‍ර ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීම හෝ මුදල් ගෙවීම සිදු නොකළ යුතු ය.**

06. සහතික අයදුම් කිරීම පිළිබඳ ඇතුළත් කර ඇති වීඩියෝ උපදෙස් මාලාව නැරඹීම නිර්දේශ කරනු ලැබේ.

07. **විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් සත්‍යාපනය කර ගැනීමට අයදුම් කරන ලද සහතිකපත්‍ර සඳහා විභාග දෙපාර්තමේන්තුව මගින් දෘඩ පිටපත් නිකුත් නොකෙරේ.**

08. විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් සත්‍යාපනය කර ගැනීම සඳහා අයදුම්කරන ලද සහතිකපත්‍රවල මෘදු පිටපත විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කෙරෙන අතර, ඒ බව විභාග දෙපාර්තමේන්තුව මගින් අදාළ **අයදුම්කරුට කෙටි පණිවිඩයක් මගින්** දැනුම් දෙනු ලැබේ. **විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් ලබා දෙන උපදෙස් අනුව කටයුතු කළ පසු** සත්‍යාපනය කරන ලද සහතිකපත්‍රයේ මෘදු පිටපත අදාළ අයදුම්කරුගේ Email ලිපිනය වෙත යොමු කෙරේ. අවශ්‍යතාව අනුව අයදුම්කරුට මෘදු පිටපත බාගත කර ගැනීමේ පහසුව සලසා ඇත. මේ සඳහා විභාග දෙපාර්තමේන්තුවට හෝ විදේශ කටයුතු අමාත්‍යාංශයට පැමිණීම අවශ්‍ය නොවේ.

09. විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් සත්‍යාපනය කර ගැනීම සඳහා යොමුකරන ලද සහතික සම්බන්ධයෙන්, අයදුම්කිරීමේ සිට යොමු අංකය සහිතව විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමුකළ බවට කෙටි පණිවුඩයක් ලැබෙන තෙක් ඇතිවන ගැටලු සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ 0112788137 දුරකථන අංකය මගින් ද ඉන්පසු ඇතිවන ගැටලු සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ 0117024798, 0112335942 යන දුරකථන අංක මගින් ද තොරතුරු ලබා ගත හැකි ය.

10. මාර්ගගත ක්‍රමයට ලබා ගන්නා සියලුම සහතිකපත්වල නිරවද්‍යතාව www.certificates.doenets.lk **Request Certificate → Certificate Issued Online** සබැඳිය හරහා සහතිකපත්‍රයේ යොමු අංකය (CX – XXXXXX) භාවිතයෙන් පරීක්ෂා කළ හැකි ය. තව ද විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් සත්‍යාපනය කරන ලද සහතිකපත්‍රවල නිරවද්‍යතාව තහවුරු කරගැනීමේ අවස්ථාව එම අමාත්‍යාංශය මගින් ප්‍රවේශ පහසුව සලසා ඇති විදේශීය තානාපති කාර්යාල සඳහා ද ලබා දී ඇත.

11. දේශීය භාවිතය සඳහා අයදුම් කරන ලද සහතිකපත්‍ර අධිවේගී තැපැල් සේවාව මගින් පමණක් අයදුම්කරු විසින් ඇතුළත් කරන ලද ලිපිනයට යොමු කෙරේ.

12. Australian වීසා සඳහා අයදුම්කරන ලද සහතිකපත් විභාග දෙපාර්තමේන්තුවට පැමිණ ලබා ගත යුතු අතර, **වලංගු විදේශ ගමන් බලපත්‍රය (Passport) සහ එහි ඡායා පිටපතක් රැගෙන පැමිණීම අනිවාර්ය වේ.**

13. Foreign Country වර්ගයේ සහතිකපත්‍ර විදේශීය ලිපිනයක් සඳහා පමණක් තැපැල් කරනු ලැබේ.

14. ප්‍රතිඵල අත්හිටුවා ඇති (Withheld) හෝ ප්‍රතිඵල තවමත් නිශ්චිතව තීරණය කර නොමැති (Not Decided "X") විෂයයන් ඇතුළත් සහතිකපත් මාර්ගගතව නිකුත් නොකෙරේ. වැඩිමනත් තොරතුරු සඳහා අයදුම්කරුවන් විභාග දෙපාර්තමේන්තුවට පැමිණිය යුතු ය.

15. විභාග දෙපාර්තමේන්තුව මගින් ලබා ගන්නා සහතිකපත්‍රයක් හෝ සේවාවක් කිසිදු නීති විරෝධී කාර්යයක් සඳහා සහ /හෝ තෙවන පාර්ශවයක පෞද්ගලිකත්වය උල්ලංඝනය වන අවස්ථා සඳහා භාවිත නොකළ යුතු ය.